**සමුපකාර සංවර්ධන හා වෙළඳ, ඉඩම්, විදුලිබල හා බලශක්ති, ක්‍රීඩා හා යොවන කටයුතු, සංස්කෘතික හා කලා කටයුතු සහ තොරතුරු තාක්ෂණ අමාත්‍යාංශය - වයඹ පළාත**

கூட்டுறவு அபிவிருத்தி மற்றும் வர்த்தக, காணி, மின்சக்தி, விளையாட்டு மற்றும் இளைஞர் விவகார, கலாச்சாரமும் கலை நடவடிக்கை மற்றும் தகவல் தொழில்நுட்ப அமைச்சு - வடமேல் மாகாணம்

**Ministry of Co- operative Development & Trade, Land, Electricity & Energy, Sports & Youth Affairs, Cultural & Arts Affairs and Information Technology -NWP**

මගේ අංකය / எனது இலக்கம் / My No. } NWP/MOCD/AD6/Di.Diriyak    ඔබේ අංකය / உமது இலக்கம் / Your No. }    දිනය / திகதி / Date } 2026.07. 14

ප්‍රාදේශීය ලේකම් මගින්,

ක්‍රීඩා නිලධාරී,

ප්‍රාදේශීය ලේකම් කාර්යාලය,

.......................................

**<u>"දිනුමට දිරියක්" වයඹ පළාත් ක්‍රීඩා ශිෂ්‍යත්ව වැඩසටහන 2026 ට අදාල අයදුම්පත් කැඳවීම.</u>**

වයඹ පළාත පුරා විසිරී සිටින ප්‍රවාහන, ආර්ථික දුශ්කරතා සහිත ක්‍රීඩක ක්‍රීඩිකාවන්ගේ පෝෂණය ඉහල නැංවීම සඳහා වයඹ පළාත් ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුව මගින් 2026 වර්ෂයේ සිට ක්‍රීඩා ශිෂ්‍යත්ව පිරිනැමීමේ වැඩසටහන ක්‍රියාත්මක කෙරේ.

2. එමගින් වයඹ පළාත තුල සිටින ඉහල කාර්යය සාධනයක් සහිත ක්‍රීඩක ක්‍රීඩිකාවන්ගේ දක්ෂතා වර්ධනය සඳහා අත්‍යවශ්‍ය සාධකයක් වන ඔවුන්ගේ පෝෂණ අවශ්‍යතා සපුරාලමින්, පුහුණු මධ්‍යස්ථාන වලට යාමට පවතින ප්‍රවාහන අපහසුතා සඳහා රුකුලක් සැපයීම තුලින් ක්‍රීඩා දක්ෂතා ඉහල නැංවීම, දිරිගැන්වීම, ක්‍රීඩාව දියුණු කිරීම සහ ජාතික හා ජාත්‍යන්තර තලයේ ජයග්‍රහණ ලබාගැනීම අපේක්ෂා කෙරේ.

3. ඒ අනුව පහත සඳහන් සුදුසුකම් සපුරනු ලබන ක්‍රීඩක ක්‍රීඩිකාවන්ගේ අයදුම්පත් 2026.08.14 දිනට පෙර ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුව වෙත එවන මෙන් කාරුණිකව දන්වමි. අයදුම්පත් යොමු කිරීමෙන් පසු සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් මගින් සුදුස්සන් තෝරා ගැනීම සිදු කරනු ලබයි.

- වයඹ පළාත තුල ස්ථිර පදිංචි අයෙකු විය යුතුයි.
- 2026.01.01 දිනට වයස අවුරුදු 24 ට නොවැඩි විය යුතුයි.
- අවසන් වසර 03 තුල පළාත්, ජාතික හෝ ජාත්‍යන්තර මට්ටමේ දක්ෂතා දක්වා ඇති දැනට ක්‍රීඩාවෙහි නියලී සිටින ක්‍රීඩකයෙකු හෝ ක්‍රීඩිකාවක විය යුතුයි.
- වෘත්තිමය ක්‍රීඩකයෙකු හෝ ක්‍රීඩිකාවක නොවිය යුතු අතර රාජ්‍ය, පෞද්ගලික හෝ වෙනත් කිසිදු රැකියාවක නිරත නොවිය යුතුයි.
- දක්ෂතා සනාථ කිරීම සඳහා ඉදිරිපත් කරන සහතික වල ( පළාත්,ජාතික හෝ ජාත්‍යන්තර ) සහතික කරන ලද ඡායා පිටපතක් අයදුම්පත සමඟ යොමු කළ යුතුයි.

ගරු ඇමතිතුමා / கௌரவ அமைச்சர் / Hon.Minister } 037 2228847 / 037 2227959 / minister.nwpmoc@gmail.com
ලේකම් / செயலாளர் / Secretary } 037 2231739 / 037 2227958(Fax) / sec.nwpmoc@gmail.com
සහකාර ලේකම් / உதவிச் செயலாளர் / Assistant Secretary } 037 2231867 / 037 2228848
අමාත්‍යාංශය / அமைச்சு / Ministry } 037 2222748 / 037 2230461 / 037 2231743 / 037 2231479 / 037 2222748 / 037 2227960 / nwpmoc@gmail.com

2 වන මහල, පළාත් සභා කාර්යාල සංකීර්ණය, කුරුණෑගල. 2ம் மாடி, மாகாண சபை அலுவலக வளாகம், குருநாகல்
2nd Floor, Provincial Council Office Complex, Kurunegala

- ක්‍රීඩා ශක්ති වැඩසටහන, ජාතික සංචිත හෝ mission Olympic වැඩසටහන වැනි වැඩසටහන් යටතේ කිසිදු ක්‍රීඩා ශිෂ්‍යත්වයක් හෝ දීමනාවක් නොලබන අයෙකු විය යුතුයි.
- 2026.08.14 දිනට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

04. එබැවින් ඔබ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ක්‍රීඩක ක්‍රීඩිකාවන් විධිමත් පරිදි දැනුවත් කිරීම හා පසු විපරම් සහිතව අයදුම්පත් ( 2026.08.14 දිනට පෙර ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුවට ලැබෙන පරිදි ) යොමු කිරීමේ කාර්යය අත්‍යවශ්‍ය හා ප්‍රමුඛ රාජකාරියක් ලෙස ඉටු කරන මෙන් කාරුණිකව දන්වා සිටිමි.

අයි.කේ.එම්.එම්.එස්.ඉලංගසේකර,
පළාත් ක්‍රීඩා අධ්‍යක්ෂ,
ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුව ( වයඹ ),
කුලියාපිටිය.

අයි.කේ.එම්.එම්.එස්. ඉලංගසේකර
පළාත් ක්‍රීඩා අධ්‍යක්ෂ (වැ.බ.)
ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුව (වයඹ)
කුලියාපිටිය.

පිටපත් :- 1. ලේකම්, ප්‍රධාන අමාත්‍යාංශය ( වයඹ ) - කා.දැ.ස.

2. ලේකම්,සමුපකාර සංවර්ධන,වෙළඳ ඉඩම්,විදුලි බල හා බල ශක්ති ක්‍රීඩා හා යෞවන කටයුතු, සංස්කෘතික අමාත්‍යාංශය (වයඹ) - කා.දැ.ස.

3. පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ,පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ කාර්යාලය(වයඹ) - අ.ක.ස.

4. කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ, කලාප අධ්‍යාපන කාර්යාලය, ........................ - අ.ක.ස.

5. පළාත් අධ්‍යක්ෂ, ජාතික තරුණ සේවා සභාව, වයඹ - අ.ක.ස.